# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2404/33 - 2024 ඔක්තෝබර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2024.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

1988 අංක 30 දරන බැංකු සංශෝධිත පනත

1988 අංක 30 දරන බැංකු සංශෝධිත පනතේ 47(4), 47(11ආ) සහ 76ඔ වගන්ති යටතේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගය.

**ආචාර්ය පී නන්දලාල් වීරසිංහ,**
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,

ශ්‍රී ලංකා මහ බැංකුව.
කොළඹ,
2024 ඔක්තෝබර් මස 01 වැනි දින.

**බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්ව සඳහා ලබා දී ඇති අනුග්‍රහයන් සඳහා වන සීමාවන්**

1988 අංක 30 දරන බැංකු සංශෝධිත පනතේ 47(4), 47(11ආ) සහ 76ඔ වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හඳුන්වනු ලැබේ.) විසින් මෙම නියෝග යෙහි සඳහන් සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබාදෙන අනුග්‍රහයන් සම්බන්ධයෙන් පහත සඳහන් සීමාවන් අනුමත කර ඇත.:

1. බලපත්‍රලාභී බැංකුවක සම්බන්ධිත පාර්ශ්වයන්

1.1 මෙම නියෝගය සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවල ''සම්බන්ධිත පාර්ශ්වයන්" ලෙස පහත සඳහන් පුද්ගල බාණ්ඩ සළකා බැලිය යුතුය.

(අ) බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයකු;

(ආ) එවැනි අධ්‍යක්ෂවරයකුගේ කිට්ටු ඥාතියකු;


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට පෙර හෝ පසුව ලබාගත් අයිතියක් මත එම බලපත්‍රලාභී බැංකුවේ අධ්‍යක්ෂවරයාට සැලෙන සම්බන්ධතාවක් ඇති ආයතනයක්;

(ඈ) බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකුගේ කිට්ටු ඥාතියෙකුට සැලෙන සම්බන්ධතාවක් ඇති ආයතනයක්;

(ඉ) බලපත්‍රලාභී බැංකුවක සේවා නියුක්තිකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ එම බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හෝ විධායක කර්තව්‍ය ඉටු කරන නිලධාරියෙකුට ප්‍රදානය කරනු ලබන යම් අනුග්‍රහයක් හැර, ප්‍රදානය කරන ලද යම් අනුග්‍රහයක් සම්බන්ධයෙන් එවැනි යම් නිලධාරියකු;

(ඊ) පුද්ගලයකු හෝ ආයතනයක් වුව ද, බලපත්‍රලාභී බැංකුවක වැදගත් අයිතිවාසිකමක් සහිත කොටස් හිමියෙකු;

(උ) බලපත්‍රලාභී බැංකුවේ පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක්;

(ඌ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බැංකුවක මව් බැංකුවක් සහ පාලිත සමාගම් හැර, බලපත්‍රලාභී බැංකුවේ පාලක සමාගමේ පාලිත සමාගම් ඇතුළුව, එම පාලක සමාගම;

(එ) බලපත්‍රලාභී බැංකුවේ පාලිත සමාගමක හෝ ආශ්‍රිත සමාගමක අධ්‍යක්ෂවරයකු;

(ඒ) බලපත්‍රලාභී බැංකුවේ පාලක සමාගමේ සහ එහි පාලිත සමාගම්වල අධ්‍යක්ෂවරයකු ;

(ඔ) ඉහත නියෝග 1.1 (ඉ) සහ (ඊ) හි දක්වා ඇති පුද්ගලයෙකුගේ කිට්ටු ඥාතියකු;

(ඕ) සිය අධ්‍යක්ෂකවරයා හෝ හවුල්කරු එම බැංකුවේ අධ්‍යක්ෂකවරයකු වන යම් ආයතනයක්;

(ක) බලපත්‍රලාභී බැංකුවක වැදගත් කොටස් හිමියකුට සැලෙන සම්බන්ධතාවක් ඇති ආයතනයක්; සහ

(ග) බලපත්‍රලාභී බැංකුවක තනි පුද්ගල වැදගත් කොටස් හිමියකුගේ කිට්ටු ඥාතියකුට සැලෙන සම්බන්ධතාවක් ඇති ආයතනයක්.

2. සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහක සම්බන්ධයෙන් අනුමත සීමාවන්.

2.1 2024 අංක 04 දරන 2024 ඔක්තෝබර් 01 දිනැති "බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහක සඳහා අනුමත සුරැකුම්" යන බැංකු පනත් නිර්ණයෙහි දක්වා ඇති අනුමත සුරැකුම් ලබා ගැනීමට යටත්ව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන් පහත සීමාවන් අනුමත කර ඇත.

(අ) ඉහත 1.1 නියෝගයේ (අ), (ආ), (ඉ), (ඊ), (එ), (ඒ) සහ (ඔ)හි පුද්ගලයන් ලෙස දක්වා ඇති සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන් රුපියල් මිලියන විස්සක් (රු. 20,000,000/-) දක්වා.

(ආ) ඉහත 1.1 නියෝගයේ (ඇ), (ඈ), (ඊ), (උ), (ඌ), (ක) සහ (ග)හි ආයතන ලෙස දක්වා ඇති සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන්; බලපත්‍රලාභී බැංකුවේ පළමු පෙළ ප්‍රාග්ධනයෙන් 10%.

(ඇ) ඉහත 1.1 නියෝගයේ (ඕ) හි ආයතන ලෙස දක්වා ඇති සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රහයන් සම්බන්ධයෙන්; බලපත්‍රලාභී බැංකුවේ පළමු පෙළ ප්‍රාග්ධනයෙන් 15%. ඉහත 2.1 නියෝගයේ (ආ) සහ (ඇ) හි දක්වා ඇති පරිදි පළමු පෙළ ප්‍රාග්ධනය යන්නට, බාහිර විගණකවරයකු විසින් සහතික කිරීමට යටත්ව,

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ 2016 අංක 01 දරන බැංකු පනත් නියෝගයේ උපදෙස් ප්‍රකාරව ගණනය කළ පෙර මූල්‍ය වර්ෂය අවසානයේ හෝ පෙර කාර්තුව අවසානයේ ගැලපීම් කිරීමට පෙර පැවති පළමු පෙළ ප්‍රාග්ධනය අදහස් කෙරේ. විගණකවරයාගේ සහතික කිරීමෙන් පසු සිදුවන පාඩුවකදී, මෙම නියෝගය ප්‍රකාරව අදාළ පාඩු පළමු පෙළ ප්‍රාග්ධනයෙන් අඩු කළ යුතු වේ.

(ඈ) අදාළ බැංකුවේ අනෙකුත් ගනුදෙණුකරුවන් සඳහා වන නියමයන් සහ කොන්දේසි මත ණය කාඩ්පතක් නිකුත් කිරීම මගින් යම් පුද්ගලයකුට අනුග්‍රාහකත්ව ලබා දී ඇති අවස්ථාවක, රුපියල් මිලියන දෙකක් (රු. 2,000,000) දක්වා.

2.2 ඉහත 2.1 නියෝගයේ දක්වා ඇති යෝජිත සීමාවන් ඉක්මවා ලබා දී ඇති අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු විසින් 2024 ඔක්තෝබර් 01 දිනැති, 2024 අංක 04 දරන "බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබාදී ඇති අනුග්‍රාහක සඳහා අනුමත සුරකුම්" යන බැංකු පනත් නිර්ණයෙහි 2.1 (අ), (ආ), (ඇ) සහ (ඈ) හි දක්වා ඇති මුදල් හෝ ආසන්න මුදල් ඇපකරයන් අනුමත සුරකුම් ලෙස ලබා ගත යුතුය.

3. අවලංගු කිරීම.

3.1 2005 පෙබරවාරි 11 දිනැති, 2005 අංක 2 දරන බැංකු (සංශෝධන) පනත මගින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 47(4) වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද බැංකු පනත් නියෝගය අවලංගු වේ.

EOG 10 - 0062

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.